# කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු - 2018

නව කෘෂි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ දැනටමත් පවත්වාගෙන යනු ලබන කෘෂි ව්‍යාපාරයක් තව දුරටත් වැඩි දියුණුකිරීමට අපේක්ෂිත ව්‍යවසායකයින් සඳහා ප්‍රයෝජනවත් වන්නාවූ එක්දින,දෙදින,තෙදින, හා සිව්දින දැනුවත් කිරීමේ සහ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් මාලාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර ඇත. ආර්ථික වශයෙන් සඵලදායි කෘෂි ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම් මෙම පාඨමාලා තුලින් ආවරණය කෙරේ.

**<u>පාඨමාලා පවත්වනු ලබන ආකාරය :</u>**

සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. එක් අයෙකුට පාඨමාලා කිහිපයකට වුවද සහභාගී විය හැකිය. පාඨමාලාවන් පැවැත්වෙන දිනයන්, පුහුණුව පැවැත්වීමට දෙසතියකට පෙරාතුව ලියාපදිංචි අයදුම්කරුවන් වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ. ඔබගේ ඉල්ලුම්පත් ලැබෙන පිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයකට ඇතුලත් කර 30 දෙනා බැගින් වූ කණ්ඩායම් වශයෙන් පාඨමාලාවන් පැවැත්වේ.

**<u>අවශ්‍ය සුදුසුකම්</u> :**

කෘෂි ව්‍යවසායකයකු වීමට බලපොරොත්තු වන තනි පුද්ගලයකු හෝ කණ්ඩායමක් වීම මූලික අවශ්‍යතාවයයි.

**<u>පාඨමාලා සඳහා ලියාපදිංචි විය යුතු ආකාරය</u> :**

පාඨමාලා ගාස්තුව (ආහාර හා නේවාසික පහසුකම් ගාස්තු හැර ) පේරාදෙණිය, මහජන බැංකුවේ **<u>කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 057-10017902 7204</u>** ට ඕනෑම මහජන බැංකු ශාඛාවකින් මුදල් තැන්පත් කිරීමෙන් පසු මුදල් ගෙවූ ලදුපත අයදුම්පතත් සමග එවීමෙන් ලියාපදිංචි විය හැකිය. (චෙක්පත්,මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

**<u>ඉල්ලුම් කරන ලද පුහුණු සඳහා නියමිත දිනට සහභාගිවීමට නොපැමිණියහොත් ආපසු කැඳවීමක් කල නොහැකි බැවින් ඔබගේ ලියාපදිංචි ගාස්තු ආපසු ගෙවීමට නොහැකි බවද කරුණාවෙන් සලකන්න. පුහුණු පාඨමාලා පවත්වනු ලබන ස්ථාන වෙනස්වීමට ඉඩ ඇත.</u>**

**<u>ආහාර හා නේවාසික පහසුකම් ගාස්තු</u> :**

පුහුණුවන්නන්ට ආහාර හා නේවාසික පහසුකම් අවශ්‍ය වන්නේ නම් පුහුණුවට සහභාගී වන දිනයේ දී අදාල ආයතනයට මුදල් ගෙවීමෙන් ලබා ගත හැක . ඒ සඳහා අදාල ගාස්තු පහත දැක්වේ. (පුහුණු ආයතන අනුව මෙම ගාස්තු වෙනස් වේ.)

- නේවාසික ගාස්තු දිනකට එක් අයෙකු සඳහා රු.150.00
- ආහාර සඳහා දිනකට එක් අයෙකු සඳහා රු.595.00

**<u>ආදර්ශ අයදුම්පත් සහ පාඨමාලා සැකැස්ම ආශ්‍රිත තොරතුරු ලබා ගත හැකි ආකාරය :</u>**

අතිරේක අධ්‍යක්ෂ ( කෘෂි ව්‍යාපාර ), තැ.පෙ.05 , කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

දුරකථන අංකය : 081-2388754 හෝ

Email : doagbiz@yahoo.com වෙතින් අයදුම්පත් ලබාගත හැකිය.

**<u>පාඨමාලා ගාස්තු ගෙවන ලද බැංකු ලදුපත සමග සම්පූර්ණ කරන ලද අයදුම්පත හැකි ඉක්මනින් ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්වීමෙන් පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක.</u>**

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :- 2018-02-11**

<u>පාඨමාලා ආශ්‍රිත තොරතුරු</u> :

| පාඨමාලා අංකය | පාඨමාලාව | කාලය | පාඨමාලා ගාස්තු දිනකට | පාඨමාලා ගාස්තු | පැවැත්වෙන ස්ථානය |
|---|---|---|---|---|---|
| 01 | එළවලු හා පලතුරු වගාවේ දී යහපත් කෘෂි පිළිවෙත් (GAP) හා අපනයනය සඳහා එළවලු හා පලතුරු වගාව | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 02 | කෘෂි ව්‍යාපාරිකයින් සඳහා විභව ව්‍යපෘති හඳුනා ගැනීම හා සැලසුම් සකස් කිරීම | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 03 | වාණිජ බිම්මල් නිෂ්පාදනය | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 04 | කාබනික කෘෂිකාර්මික තාක්ෂණය | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව හා මාකඳුර (කුරුණෑගල ) |
| 05 | පලතුරු උයන් පාලනය | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 06 | පලතුරු පැල තවාන් පාලනය | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 07 | වාණිජ මීමැසි පාලනය | දින 03 | රු.500.00 | රු.1500.00 | බිඳුණුවැව ( බණ්ඩාරවෙල ) |
| 08 | ආහාර බෝග වලින් භූමි අලංකරණය හා නාගරික කෘෂිකාර්මික ක්‍රමවේදයන් | දින 03 | රු.500.00 | රු.1500.00 | ලබුදූව ( ගාල්ල ) |
| 09 | වාණිජ වැල්දොඩම් හා පැපොල් වගාව | දින 02 | රු.500.00 | රු.1000.00 | අඟුණකොළපැලැස්ස |
| 10 | වාණිජ පේර වගාව හා ඩ්‍රැගන් ෆෘට් වගාව | දින 02 | රු.500.00 | රු.1000.00 | අඟුණකොළපැලැස්ස |
| 11 | ව්‍යාපාරයක් වශයෙන් හෙළ බොජුන් ලෙසින් අලෙවිසැල් පවත්වා ගෙන යාම | දින 02 | රු.500.00 | රු.1000.00 | ගන්නොරුව |
| 12 | ආරක්ෂිත ගෘහ තුල අපනයන හා සුපිරි වෙළඳපල විභවයන් සහිත බෝග වගාව | දින 04 | රු.500.00 | රු.2000.00 | ගන්නොරුව |
| 13 | වාණිජ කටු අනෝදා වගාව | දින 02 | රු.500.00 | රු.1000.00 | අඟුණකොළපැලැස්ස |
| 14 | වාණිජ ගොවිපල සඳහා ක්ෂුද්‍ර ජලසම්පාදන තාක්ෂණය භාවිතය | දින 03 | රු.500.00 | රු.1500.00 | පුලියන්කුලම ( අනුරාධපුර ) |
| 15 | වාණිජ ඇන්තුරියම් වගාව | දින 01 | රු.500.00 | රු.500.00 | මාකඳුර ( කුරුණෑගල) |

# ආදර්ශ අයදුම්පත

01 සහභාගී වන්නාගේ නම ............................................................................... මයා /මිය /මෙය

02 ලිපිනය හා දුරකථන අංකය ...............................................................................................

...........................................................................................................................................

| පාඨමාලාවේ නම | පාඨමාලා අංකය | නවාතැන් (අවශ්‍ය වේ /නොවේ) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

උක්ත පාඨමාලාව/පාඨමාලාවන් ලියාපදිංචි වීමේ ගාස්තුව වශයෙන් අංක ....................................දරණ රු......................................ක මහජන බැංකු ලදුපතක් මේ සමග එවමි.

......................

අත්සන